# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,561 — 1965 නොවැම්බර් 19 වැනි සිකුරාදා — 1965.11.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් සංඛ්‍යාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය .. | — | ආණ්ඩුවේ නිවේදන .. .. .. | 1618 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය .. .. | 1615 | මිළ පාලන දැන්වීම් .. .. .. | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය .. | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. .. .. | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය .. | 1615 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. .. | — |
| වෙනත් පත් කිරීම් ආදිය .. .. .. | 1617 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ .. .. | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය .. .. | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. .. .. | 1622 |
| | | "පුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දැන්වීම් .. .. | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 424

අංකය : ඕ 32/රෙක්ට්.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරනු ලැබූ අ.පසු පත් කිරීමක්

1965 නොවැම්බර් 2 වෙනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ කොමාන්ඩර් (සැ) පදවියට ආපසු පත් කිරීම :—

තාවකාලික කපිතාන් (සැ) කෙනත් මේට්ලන්ඩ් මාටිනස්, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1965 නොවැම්බර් 11 දින,
කොළඹ දීය.

11-655

1965 අංක 425

අංකය : ඩී. 23/රෙක්ට්/98.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 1965 නොවැම්බර් මස 20 වැනි දින සිට රාජකීය ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගනී :—

ස්කොඩ්රන් ලීඩර් එස්. එන්. සමරසිංහ (01005)—සාලන.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1965 නොවැම්බර් 10 වෙනිදා,
කොළඹ දීය.

11-656

1965 අංක 426

අංකය : ඕ/ඊඑෆ්ජ්/මිශ්‍ර/132.

### යුද්ධ හමුදාව—ලංකා සෙවන්ජ බලසේනාව—අණදෙන නිලය දැරීමේ සේවය දීර්ඝ කිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කිරීම

ලංකා සෙවන්ජ හට සේනා නීති රීති මාලාවේ 69 වැනි රීතිය ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 4 වන සංවර්ධන නිර්මාණ රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු (සෙවන්ජ) හි, අණදෙන නිලධාරි කර්නල් රාසනායගම් කුමාරනායගම්, ඊඩී., ගේ අණදෙන නිලය 1964 දෙසැම්බර් 19 වැනි දින සිට මාසයකින් දීර්ඝ කර තිබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1965 නොවැම්බර් 11 දින,
කොළඹ දීය.

11-654

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 427

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේ. එල්. 6/සී.

වී. එම්. කුමාරසවාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා 1965 නොවැම්බර් 22 වැනි දින සහ 1965 දෙසැම්බර් 7 වැනි දින සිට 13 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් විනිසුරු තැන, ගම්පොල මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහේස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 11/62.

ඒ. අභාපත්තු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වි. පී. අබේවික්‍රම මහතා 1965 නොවැම්බර් 5 වැනි දින, බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ-වියලුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ බුත්තල ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. රාසයියා මහතා 1965 නොවැම්බර් 13 වැනි දින, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුරු, වලිකාමම් නැගෙනහිර, වඩමරච්චි සහ යාපනේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්. 43/57.

ඩබ්ලිව්. අයි. පේරත් මහතා 1965 නොවැම්බර් 23 වැනි දින සිට මැදවච්චිය ගම්බද උසාවියේ අංක 9023 දරණ අපරාධ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු, උතුරු, නැගෙනහිර හා බටහිර නුවරගම් පලාත ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන්.

සී. ඊ. ජයවර්ධන,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 නොවැම්බර් මස 12 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

11-713

---

## වෙනත් පත්කිරීම් ආදිය

1965 අංක 428

අංකය : ඩී 32/රෙක්ට්.

### රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන්ගේ ස්ථිර කිරීම්

1964 මාර්තු 1 දින සිට උප ලුතිනන්වරු හැටියට :—

වැඩබලන උප ලුතිනන් ඒ. එම්. ඒ. පී. අභයවර්ධන, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් ඒ. විජයතිලක, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් පී. අම්බලවානර්, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් එන්. ජී. ඒ. ප්‍රනාන්දු, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් සී. බී. ජයකොඩි, රා. ලං.නා.හ.

1964 මාර්තු 1 දින සිට උප ලුතිනන්වරු (ඉ) හැටියට :—

වැඩබලන උප ලුතිනන් (ඉ) ටී. ජේ. පී. ද සිල්වා, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් (ඉ) පී. ජේ. සැමුවෙල්, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් (ඉ) එච්. එල්. එල්. එම්. කරුණාරත්න, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් (ඉ) අයි. එම්. තිලකරත්න, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් (ඉ) එෆ්. එච්. ජේ. පෙරේරා, රා.ලං.නා.හ.

1964 මාර්තු 1 දින සිට උප ලුතිනන්වරු (එල්) හැටියට :—

වැඩබලන උප ලුතිනන් (එල්) එම්. එස්. සිරිවර්ධන, රා.ලං.නා.හ.
වැඩබලන උප ලුතිනන් (එල්) ආර්. අයි. සමරතුංග, රා.ලං.නා.හ.

එම්. ජේ. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් 7 දින,
කොළඹ දීය.

11-758

---

1965 අංක 429

මගේ අංකය : ඩීඑම්/4/1/11 එෆ් (11).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම පහත දැක්වූ දිනයෙහි සිට බල පැවැත්වේ :—

1965 සැප්තැම්බර් මස 28 වැනි දින සිට නැවත නියම කරන තුරු ලංකා විදේශ සේවයේ සිව් වැනි පෙළේ එල්. බී. සී. මොණරවෙල මහතා මහජන චීන සමූහාණ්ඩුවේ ලංකා තානාපති කාර්යාලයේ තුන් වැනි ලේකම් වශයෙන්.

ඇම්. ජේ. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
ස්ථිර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

1965 නොවැම්බර් මස 10 දින,
කොළඹ 1, රා. ආ. වි. අමාත්‍යාංශයේ දීය.

11-615/1

1965 අංක 430

මගේ අංකය : ඩීඑම්/4/1/11 එෆ් (11).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම පහත දැක්වූ දිනයෙහි සිට බල පැවැත්වේ :—

1965 ඔක්තෝබර් 25 වැනි දින සිට නැවත නියම කරන තුරු ලංකා විදේශ සේවයේ සිව් වැනි ශ්‍රේණියේ ජී. බී. අයි. ජී. සෙනෙවිරත්න මහතා බ්‍රිතාන්‍යයේ ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ දෙවැනි ලේකම් වශයෙන්.

ඇම්. ජේ. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
ස්ථිර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

1965 නොවැම්බර් මස 10 දින,
කොළඹ 1, රා.ආ.වි. අමාත්‍යාංශයේදීය.

11-615/2

---

1965 අංක 431

මගේ අංකය : ඩීඑම්/4/1/11 එෆ් (11).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම පහත දැක්වූ දිනයෙහි සිට බල පැවැත්වේ :—

1965 අගෝස්තු 2 වැනි දින සිට නැවත නියම කරන තුරු ලංකා විදේශ සේවයේ සිව් වැනි පෙළේ එන්. සිල්වා මහතා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

ඇම්. ජේ. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
ස්ථිර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

1965 නොවැම්බර් මස 10 දින,
කොළඹ 1, රා. ආ. වි. අමාත්‍යාංශයේ දී ය.

11-615/3

---

1965 අංක 432

මගේ අංකය : ඩීඑම්/4/1/11 එෆ් (11).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම පහත දැක්වූ දිනයෙහි සිට බල පැවැත්වේ :—

1965 ජූලි මස 20 වැනි දින සිට නැවත නියම කරන තුරු ලංකා විදේශ සේවයේ පස් වැනි පෙළේ ඒ. අබේවර්ධන මහතා මැලේසියාවේ ලංකා මහ කොමසාරිස් කාර්යාලයට අනුයුක්තව සිටීමට.

ඇම්. ජේ. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
ස්ථිර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

1965 නොවැම්බර් මස 10 දින,
කොළඹ 1, රා. ආ. වි. අමාත්‍යාංශයේ දී ය.

11-615/4

---

1965 අංක 433

ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇත :—

75/1/13 (එම්සීඑ) II වෙළුම.

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ පී. එච්. ප්‍රේමවර්ධන මහතා, නැවත නියමයක් කරනතුරු, 1965 සැප්තැම්බර් 23 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

75/3/20 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න මහතා, 1964 මාර්තු 13 වැනි දින සිට 1964 ජූලි 31 වැනි දින දක්වා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) වශයෙන්.

75/3/20 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එස්. ගුණධීර මහතා, නැවත නියමයක් කරන තුරු, 1964 අගෝස්තු 17 වැනි දින සිට නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක (පාලන) වශයෙන්.

75/3/6 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ සී. ආර්. ද සිල්වා මහතා 1965 මාර්තු 27 වැනි දින සිට 1965 සැප්තැම්බර් 26 වැනි දින දක්වා නියෝජ්‍ය සමුපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන්.

75/2/25 (එම්සීඒ).

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ඊ. එම්. විජේනායක මහතා, නැවත නියමයක් කරන තුරු, 1965 මාර්තු 27 වැනි දින සිට ආනයන හා අපනයන පාලක වශයෙන්.

75/4/16 (එම්සීඒ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ එල්. බී. මදුරුම මහතා, නැවත නියමයක් කරනතුරු, 1965 ඔක්තෝබර් 11 වැනි දින සිට සහකාර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වශයෙන්.

75/10/672 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ එන්. එල්. විජයරත්න මෙනෙවිය එක්සත් රාජධානියේ ලංකා මහා කොමසාරිස් කාර්යාලයේ වාණිජ සහකාර තනතුරේ සේවය සඳහා 1965 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයට අනුයුක්තව සිටීමට.

75/10/674 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ ඒ. එෆ්. ලූඩොවයික් මහතා 1965 සැප්තැම්බර් මස 19 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඉරාකයේ ලංකා දූත මණ්ඩලයේ වාණිජ සහකාර වශයෙන්.

75/10/738 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ වී. නඩරාජා මහතා, 1965 ජූලි මස 19 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, සමාජසේවා දෙපාර්තමේන්තුවේ පාලන සහකාර වරයෙකු වශයෙන්.

75/10/266 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ පී. බී. දිසානායක මහතා 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තගේ කාර්යාල සහකාර වශයෙන්.

75/10/371 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ එන්. ඒ. ඔබඩගේ මහතා, 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, ගාල්ලේ පාලන දිස්ත්‍රික්කයේ හීනිදුම් පත්තු කොට්ඨාශයේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි වශයෙන්.

75/10/246 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ කේ. කන්දසාමි මහතා, 1965 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, යාපනයේ කච්චේරියට අනුයුක්තව සිටීමට.

75/10/219 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ ඒ. බී. ඒ. මැදිවක මහතා, 1965 ජූලි මස 26 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තගේ කාර්යාල සහකාර වශයෙන්.

හෙ. ජිනදාස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ, 1965 නොවැම්බර් මස 9 දා.

11-778

---

**1965 අංක 434**

අතිගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව, එතුමා විසින්—

අංක : ඒ. ජේ. 9/1/61.

1. අබේකෝන් මුදියන්සේලාගේ මුතු බණ්ඩා අබේකෝන් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 28/12.

2. දසනායක මුදියන්සේලාගේ දසනායක මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 28/11.

3. රුකුණායකගේ චාල්ස් හෙන්රි සෝමරත්න මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 2/34.

4. වීරප්පෙරුම කංකානමලාගේ සෝමපාල මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

5. විජේසිංහ ආරච්චිගේ බාර්ලි රණනායක මහතා බස්නාහිර පළාත සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත්කර ඇත්තේය.

බී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.11.15 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-745

---

**1965 අංක 435**

(20 වෙනි පරිච්ඡේදය) වන ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1965.10.13 වෙනි දින සිට කෑගල්ල දිස්ත්‍රික්කයේ වල්ගම් පත්තුවේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ගිමුනි සිරිසේන මහතා පත් කර ඇත්තේ ය.

බී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.11.15 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-744

---

**1965 අංක 436**

## දැන්වීමයි

චාර්ල්ස් විලියම් රිචර්ඩ් ද වොස් මහතා ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දීය.

11-701

---

# ආණ්ඩුවේ නිවේදන

ඉ. වා. හාවි/අමා. අංක ජේ. 258 (බීආර්)

අ. ආ. කා. අංක ඇල්.91.

1964දී අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ 6 (ඒ) සහ 6 (බී) වැනි වගන්තිවලින් සංශෝධිත (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19 වැනි වගන්තියේ (1) සහ (2) වැනි උප වගන්තිවල විධිවිධාන යටතේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ගරු ඇමති තුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින් එෆ්. කැරගල මහතා සහ මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරේසිරා මහතා, 1965 නොවැම්බර් 15 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා එහි සඳහන් වන පරිදි ඇපැල් නඩු විසඳීම සම්බන්ධ සමාලෝචන මණ්ඩලයේ තක්සේරු සාමාජිකයින් වශයෙන් පත් කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 නොවැම්බර් 15 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11-777

ඇල්. ඩී.—බී. 126/50

අංකය: ඩී. 47/ඊවී.

## යුධ හමුදා පනත

(357 වැනි අධිකාරය වන) යුධ හමුදා පනතේ 24 වැනි හා 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ඔක්තෝබර් මස 28 දින,
කොළඹ දීය.

### නියෝගය

1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කර වරින්වර සංශෝධනය කරන ලද 1961 යුධ හමුදා වැටුප් සංග්‍රහය එහි 38 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි "හිමිකම් ලැබිය යුතුය" යන පද වෙනුවට පහත සඳහන් පද ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"හිමිකම් ලැබිය යුතුය :

එසේ වුව ද යුද්ධ හමුදාව විසින් එසේ ඇඳුම් අප්පුල්ලා දීම කළ නොහැකි අවස්ථාවක, යුද්ධ හමුදාවේ ආඥාධිපති විසින් නිශ්චය කළ හැකි එබඳු දීමනාවක් ස්වකීය යුද්ධ ඇඳුම් අප්පුල්ලවා ගැනීම සඳහා ලැබීමට ඔහුට හිමිකම් තිබිය යුතුය."

11-612/1

---

ඇල්. ඩී.—බී. 126/50

අංකය: ඩී. 47/ඊවී.

## නාවික හමුදා පනත

(358 වැනි අධිකාරය වන) නාවික හමුදා පනතේ 161 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ඔක්තෝබර් මස 28 දින,
කොළඹ දීය.

### නියෝගය

1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කර වරින් වර සංශෝධනය කරන ලද 1961 නාවික හමුදා වැටුප් සංග්‍රහය එහි 36 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි "අප්පුල්ලා ගැනීමට හිමිකම් තිබේ" යන පද වෙනුවට පහත සඳහන් පද ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"අප්පුල්ලා ගැනීමට හිමිකම් තිබේ :

එසේ වුවද නාවික හමුදාව විසින් එසේ ඇඳුම් අප්පුල්ලා දීම කළ නො හැකි අවස්ථාවක නාවික හමුදාධිපති විසින් නිශ්චය කළ හැකි එබඳු දීමනාවක්, ස්වකීය නාවික ඇඳුම් අප්පුල්ලවා ගැනීම සඳහා ලැබීමට ඔහුට හිමිකම් තිබිය යුතුය."

11-612/2

---

ඇල්. ඩී.—බී. 126/50

අංකය: ඩී. 47/ඊවී.

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 24 වැනි හා 155 වැනි වගන්ති යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1965 ඔක්තෝබර් මස 28 දින,
කොළඹ දීය.

### නියෝගය

1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කර වරින් වර සංශෝධනය කරන ලද 1961 ගුවන් හමුදා වැටුප් සංග්‍රහය එහි 35 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි "හිමිකම් ලැබිය යුතුය" යන පද වෙනුවට පහත සඳහන් පද ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"හිමිකම් ලැබිය යුතුය :

එසේ වුවද ගුවන් හමුදාව විසින් එසේ ඇඳුම් අප්පුල්ලා දීම කළ නොහැකි අවස්ථාවක, ගුවන් හමුදාධිපති විසින් නිශ්චය කළ හැකි එබඳු දීමනාවක්, ස්වකීය හමුදා ඇඳුම් අප්පුල්ලවා ගැනීම සඳහා ලැබීමට ඔහුට හිමිකම් තිබිය යුතුය."

11-612/3

---

ඇල්.ඩී.—බී. 132/29

## රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සමාගම් ආඥාපනත

(283 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සමාගම් ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සමාගම විසින් පනවනු ලැබ, එම වගන්තියෙන් මුදල් ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාව.

ගෙ. ජිනදාස සමරක්කොඩි,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් 28,
කොළඹ දීය.

### ව්‍යවස්ථාව

1892 ජුනි 17 වැනි දින අංක 5,147 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත ව්‍යවස්ථා, පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) 1 වැනි පරිච්ඡේදය—සාමාන්‍ය ව්‍යවස්ථා යන ශීර්ෂය යටතේ—

(අ) එහි 4 වැනි ව්‍යවස්ථාවෙහි අන්තිම අතුරු විධානයෙහි "අවුරුදු 60" යන පද වෙනුවට "අවුරුදු 55" යන පද ආදේශ කිරීමෙන්,

(ආ) එහි 7 ආ (3) වැනි ව්‍යවස්ථාවෙහි "(ආ)" අනුච්ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් අනුච්ඡේද අන්තර්ගත කිරීමෙන්,

(ඈ) වැඩ තහනම් කොට ඇති නිසා එවැනි මුදලක් ගෙවීමට නො හැකි වුවද නැවත සේවයට ගැනීමෙන් හෝ විශ්‍රාම ගැනීමෙන් පසු මාස තුනක් ඇතුළත, මුදල් ගෙවනු ලබන දිනය දක්වා ගෙවිය යුතුව ඇති සියලුම මුදල් සාමාජිකයෙකු විසින් ගෙවූ විට, සහ

(ඉ) අවස්ථාවෝචිත පරිදි, විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය, ප්‍රදානය කිරීමේ දී සිදුවුණු ප්‍රමාදයක් නිසා එවැනි මුදලක් ගෙවීමට නොහැකිවූ නමුදු එවැනි ප්‍රදානයක් ලැබී මාස තුනක් ඇතුළත මුදල් ගෙවනු ලබන දිනය දක්වා ගෙවිය යුතුව ඇති සියලුම මුදල් සාමාජිකයකු විසින් ගෙවූ විට.

(ඇ) එහි 10 අ (ii) වැනි ව්‍යවස්ථාවෙහි—

(i) (ආ), (ඇ) හා (ඈ) යන වගන්ති (ඇ), (ආ) හා (ඉ) යන වගන්ති වශයෙන් පිළිවෙළින් නැවත අංක යෙදීමෙන් ; හා

(ii) (අ) වගන්තියට ඉක්බිතිව ම, පහත සඳහන් අළුත් ඡේදය අන්තර්ගත කිරීමෙන් :—

"(ආ) පාලන කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සමාගමේ මුලු වියදම් වලින් දහයෙන් එකක් නොඉක්මවා යන වියදම් වලින් අනුපාතයක් මරණ පරිත්‍යාග වර්ධන සංචිත අරමුදලට භාර කළ යුතුය." තවද

(2) 11 වන පරිච්ඡේදය—රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථ සාධක සමාගමේ අතිරික්ත මුදල් නිවාස ණය වශයෙන් ආයෝජනය කිරීම පිළිබඳ නියෝග යන ශීර්ෂය යටතේ—

තුන්වන ඡේදයට ඉක්බිතිව ම 10 වැනි ව්‍යවස්ථාවෙහි, පහත සඳහන් අළුත් ඡේදය අන්තර්ගත කිරීමෙන් :—

"මුදල් ගෙවිය යුතුව ඇති මාසයේ හෝ කාර්තුවෙන් පසු මාසයේ 10 වෙනි දිනට ප්‍රථමයෙන්, මුල් මුදලෙන් කොටසක් හෝ පොලිය හෝ ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ මුල් මුදල් කොටස හෝ ඒ පොලිය නොගෙවා පැහැර හරිනු ලැබූ ලෙස සැළකිය යුතු ය. මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් මුදල් ගෙවීම පැහැර හරිනු ලැබූ සාමාජිකයන්ට කාරක සභාව විසින් තීරණය කරන පරිදි දඬුවම් දීමකින් පසු ණය මුදලෙන් ගෙවිය යුතුව ඇති සම්පූර්ණ මුදල ගෙවන ලෙස පාලන කාරක සභාව ඉල්ලා සිටිය හැකි ය."

11-776

ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩල පනතේ (260 වැනි අධිකාරය) පිළිවෙලින් 3 (9) හා 3 (2) වැනි වගන්තින් යටතේ, ඩී. ඩබ්ලිව්. ආර්. කහවිට මහතා—

(අ) 1965 සැප්තැම්බර් මස 1 වැනි දින පටන් ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් වැඩ බැලීමටද,

(ආ) 1965 සැප්තැම්බර් මස 1 වැනි දින පටන් ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් ද,

ගරු ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා විසින් සතුටින් පත් කර ඇති බව පොදු දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ශ්‍රීකාන්ත,
ස්ථිරලේකම්,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.

1965 නොවැම්බර් මස 2 වැනි දින,
කොළඹ දී ය.

11-469/1

---

ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩල පනතේ (260 වැනි අධිකාරය) පිළිවෙලින් 3 (9) හා 3 (1) වැනි වගන්තින් යටතේ, සී. ආර්. කරුණාරත්න මහතා—

(අ) 1965 සැප්තැම්බර් මස 1 වැනි දින පටන් ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් වැඩ බැලීමටද,

(ආ) 1965 නොවැම්බර් මස 1 වැනි දින පටන් ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් ද,

ගරු ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා විසින් සතුටින් පත් කර ඇති බව පොදු දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ශ්‍රීකාන්ත,
ස්ථිර ලේකම්,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.

1965 නොවැම්බර් මස 2 වැනි දින,
කොළඹ දී ය.

11-469/2

---

ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩල පනතේ (260 වැනි අධිකාරය) 3 (1) වැනි වගන්තිය යටතේ වික්ටර් රත්නායක මහතා, 1965 සැප්තැම්බර් මස 1 වැනි දින පටන් ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් ගරු ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමා විසින් සතුටින් පත් කර ඇති බව පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ශ්‍රීකාන්ත,
ස්ථිර ලේකම්,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.

1965 නොවැම්බර් මස 2 වැනි දින,
කොළඹ දීය.

11-469/3

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් වශයෙන් 1965 මැයි 17 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ සේවය කිරීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු, රැකීරක්ෂා හා නිවාස ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. බී. වීරසිංහ,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දීය.

**නම නියම කොට පත් කරනු ලබන සාමාජිකයෝ :**

1. ව්. සිවප්‍රකාසපිල්ලේ මහතා
2. පී. සන්ගරපිල්ලේ මහතා
3. ඒ. ආර්. ද සිල්වා මහතා

සේව්‍ය නියෝජිතවරු :

1. ආල්. ඊ. වීරසේකර මහතා
2. ඒ. මැක්නිල් විල්සන් මහතා
3. ජී. කේ. මොලිස් මහතා
4. ඊ. වනිගසේකර මහතා
5. ට්. තවරාසන් මහතා
6. ඉයන් ඊ. අමරසිංහ මහතා
7. පී. ට්. සෙල්ලදෙරේ මහතා
8. ඇස්. ඒ. ජ්නානිමල් මහතා
9. අර්ඩ්ලි ද සිල්වා මහතා

සේවක නියෝජිතවරු :

1. තිලක කුලසේකර මහතා
2. ඩබ්ලිව්. එඩ්මන්ඩ් මහතා
3. ආර්. ආර්. ජේම්ස් ප්‍රනාන්දු මහතා.
4. ඇස්. ඒ. ඩබ්ලිව්. සිල්වා මහතා
5. ආර්. වීරකෝන් මහතා
6. ඇන්. ෂන්මුගදාසන් මහතා
7. එච්. පී. ආරියදාස මහතා
8. එච්. ඩී. වෙඩිවර්ධන මහතා
9. ජී. ලංකා පෙරේරා මහතා

11-710

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් 1964 නොවැම්බර් මස 8 වැනි දින සිට අවුරුදු 3ක කාලයක් තුළ සේවය කිරීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. බී. වීරසිංහ,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්,

1965 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දීය.

නම නියම කොට පත් කරනු ලබන සාමාජිකයෝ :

1. සමාධාන විනිශ්චයකාර නැන්සන් ලුයන්දිරම් ඩබ්ලිව්. ඉ. ඇල්විටිගල මහතා
2. වී. ආර්ජ්. ගුණරත්න මහතා
3. ඇම්. ආර්ජ්. ඒ. ජවාර්ඩ් මහතා

සේව්‍ය නියෝජිතයෝ :

1. එච්. ඊ. පී. ද මැල් මහතා
2. බී. හැල්ස්ට්‍රම් මහතා
3. ඒ. එච්. සී. අබේවර්ධන මහතා
4. ආල්. ඊ. වීරසේකර මහතා
5. ඇන්. යූ. ජ්වරින්බර්ග් මහතා

සේවක නියෝජිතයෝ :

1. ඩොරික් ද සූසා මහතා
2. ඒ. එච්. කරුණාපාල මහතා
3. ඇන්. ෂන්මුගදාසන් මහතා
4. වොට්සන් ප්‍රනාන්දු මහතා
5. මෙරිල් ප්‍රනාන්දු මහතා

11-709

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් වශයෙන් 1965 මැයි මස 17 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ සේවය කිරීම සඳහා (136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු, රැකීරක්ෂා හා නිවාස ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. බී. වීරසිංහ,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1965 නොවැම්බර් මස 4 වැනි දින,
කොළඹ දීය.

**නාම නියමකොට පත් කළ සාමාජිකයෝ :**

1. බර්නාඩ් ද සිල්වා මහතා,
2. ජී. සී. නානායක්කාර මහතා,
3. එම්. එම්. තලීම් මහතා.

**සේවා නියෝජිත සාමාජිකයෝ :**

1. එල්. ටී. වීරසේකර මහතා,
2. එච්. ඩබ්ලිව්. මුවර් මහතා,
3. සී. එම්. එෆ්. ජෙනිංස් මහතා,
4. ආර්. ඩී. හින්ටන් මහතා,
5. ෆිලික්ස් ආර්. ද සොයිසා මහතා,
6. ටී. ඒ. ද සිල්වා මහතා,
7. ජී. බී. එස්. ගෝමස් මහතා,
8. බී. සී. විජේරත්න මහතා,
9. ෆ්‍රැන්සිස් ගුණරත්න මහතා.

**සේවක නියෝජිත සාමාජිකයෝ :**

1. තිලක කුලසේකර මහතා,
2. ඩී. ජේ. ජේ. රණසිංහ මහතා,
3. ජේ. එම්. ගුණදාස මහතා,
4. එච්. සී. වෙඩිවර්ධන මහතා,
5. හෙන්රි විතානාච්චි මහතා,
6. ඩබ්ලිව්. පී. ද මෙල් මහතා.
7. සී. එම්. බැනියෙල් මහතා,
8. එන්. ෂන්මුගදාසන් මහතා,
9. ඩී. ඒ. සේතුංග මහතා.

11-589

---

## මිළ පාලන පනත

(විවිධ භාණ්ඩ) මිල පාලක විසින් පනවනු ලැබ 1965 ඔක්තෝබර් 21 වැනි දින අංක 14,538 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ලාම්පු මැන්ටල්වල මිලට අදාළ වන ඇඟුව වාණිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිළ පාලන පනතෙහි 4 (7) වෙනි වගන්තිය යටතෙහි මෙසින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ව්. ටී. ඒ. ද ෆොන්සේකා,
සථිර ලේකම්,
වාණිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1965 නොවැම්බර් 11 වැනි දින,
කොළඹ.

11-768

---

## මිළ පාලන පනත

(2 වැනි අධිකාරය වන) අර්ථ නිරූපන ආඥාපනතේ 12 වැනි වගන්තිය සමග කියවිය යුතු (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 2 වැනි වගන්තිය යටතේ වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් මීට යාකොට ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් තැනැත්තන් ඔවුන්ගේ රාජකාරිවලට අමතරව 1965 නොවැම්බර් 11 වැනි දින සිට මුළු දිවයින සඳහා (විවිධ ද්‍රව්‍ය) සහකාර මිල පාලකවරුන් වශයෙන් පත් කර ඇත.

ඩී. ව්. ටී. ඒ. ද ෆොන්සේකා,
සථිර ලේකම්,
වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1965 නොවැම්බර් 11 වැනි දින,
කොළඹ දිය.

### උපලේඛනය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සියළුම පාලන සහකාරයින්

සියළුම අලෙවි සංවර්ධන සහකාර කොමසාරිස්වරුන්

සියළුම සමුපකාර සංවර්ධන උප කොමසාරිස්වරුන්

සියළුම ආණ්ඩුවේ උප දිසාපතිවරුන්

සියළුම දිස්ත්‍රික් කාර්මික ව්‍යාප්ත නිලධාරීන්

සියළුම දිස්ත්‍රික් ඉඩම් නිලධාරීන්

සියළුම ප්‍රාදේශීය අලෙවි නිලධාරීන්

ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සියළුම දිස්ත්‍රික් නිලධාරීන්

සියළුම ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සියළුම විධායක ඉංජිනේරුවන්

දිසාපති කාර්යාලවලට අනුයුක්ත සියළුම අතිරේක කාර්යාල සහකාරයින්

සියළුම ඉඩම් නිලධාරීන්

සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්

දිසාපති කාර්යාලවලට අනුයුක්ත සියළුම කාර්යාල සහකාරයින්

සියළුම සෞඛ්‍ය සේවා අධිකාරීන්.

11-767

---

## 1954 අංක 37 දරන ජාතික නිවාස පනත

49 ඡෙදය යටතේ සහතිකය

කම්කරු, රැකීරක්‍ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙසින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්‍ෂා හා නිවාස ඇමති.

28.10.65, කොළඹ දිය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පන්විකාවත්ත ග්‍රාමසේවක වසමේ, සිරි සංඝරාජ මාවතේ පිහිටි වරිපනම් අංක 165, 179, 181 සහ 183 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති, අක්කර 1 සි, රූඩ් 2ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ඇල සහ ඇලකන්ඩිය ;

නැගෙනහිරට : හාජර සභාවට අයිති ප්‍රසිද්ධ මැසිකිලිය (වරිපනම් අංක 185) හා සිරි සංඝරාජ මාවතේ, වරිපනම් අංක 201 දරණ ඉඩම ;

දකුණට : සිරි සංඝරාජ මාවත ;

බස්නාහිරට : සිරි සංඝරාජ මාවතේ පිහිටි වරිපනම් අංක 149/1 සහ 149/14 දරණ පුද්ගලික ඉඩම.

11-592

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 ඡෙදය යටතේ සහතිකය

කම්කරු, රැකීරක්‍ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තරසර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙසින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්‍ෂා හා නිවාස ඇමති.

1965.10.27 දින,
කොළඹ දිය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අලුත්කුරු කෝරළයේ අඹතලේන් පහළ කොලොන්නාව පළාත් පාලන සභා ප්‍රදේශයට අයත් අංක 511, වැල්ලම්පිටිය ග්‍රාම සේවක වසමේ පිහිටි කැටකාලගහවත්ත නමැති ඉඩමින් කේ. එම්. සමරසිංහ, බලයලත් මිනින්දෝරු තැන විසින් අංක 1092 හා 1963.12.18 දින දරණ මානක සැලැස්මේ ලොට් 2 වශයෙන් පෙන්නුම් කර ඇති පර්චස් 16.50ක් විශාල ඉඩම. මෙකී ඉඩමට මායිම් :—

උතුරට : සහෝබ් මාවත ;

නැගෙනහිරට : ජේ. ඩී. එඩ්වින් පෙරේරාට අයත් වරිපනම් අංක 125 (අවිස්සාවේල්ල පාර) දරණ මෙම ඉඩමේම කොටසක් ;

දකුණට : අවිස්සාවේල්ල පාර ;

බටහිරට : ඉහත සඳහන් සැලැස්මයේ ලොට් 1 වශයෙන් පෙන්වන ඉඩම.

11-636

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

අංක 14,526 සහ 1965.10.6 වැනි දාතමින් පළවූ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය (අති විශේෂ) ගැනයි. එහි සඳහන් පහත දැක්වෙන ඉල්ලුම් පත් භාරගැනීමේ අවසාන දිනය 1965.11.30 වැනිදා තෙක් දීර්ඝ කර තිබේ.

(1) ලියාපදිංචිවීම සඳහා අයදුම් පත්‍රය—" ඒ " ෆෝරමය (නිවේදන අංක 3 යටතේ),

(2) අමුද්‍රව්‍ය ආනයනය සඳහා අයදුම් පත්‍රය—" බී " ෆෝරමය (නිවේදන අංක 4 යටතේ),

(3) තීන්දු නොකළ ඉල්ලුම්පත්—" සී " ෆෝරමය (දැන්වීම් අංක 6 යටතේ),

(4) අමුද්‍රව්‍ය ආනයනයන් සැපයීමේ රට අනුව වර්ග කරනය—" ඊ " ෆෝරමය (දැන්වීම් අංක 7 යටතේ).

ආර්. සී. ද සිල්වා,
සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

11-729

---

ඇල්. 2367.

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනය

### ආඥාපනතේ (402 අධිකාරය) 71 වෙනි වගන්තිය යටතේ කරගත් යම්මතයයි.

1965.3.17 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කරගත් බව මෙයින් දැනුම් දෙමි.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුඵලාත මත්ගමුවේ පදිංචි (1) මඩවල මහානාම රත්නවිභූසන (2) මඩවල රත්නවිභූසන (3) ප්‍රේමදාස දේවසුරේන්ද්‍ර සහ (4) දේවුරත්න දේවසුරේන්ද්‍ර යන අය විසින් ගම්පොළ ජන නොතාරිස් වන ජේ. පාලක්‍රිෂ්නන් විසින් 61.5.20 දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනය නමට ලියා සහතිකකරන ලද අංක 51 දරන උකස්කරයේ ප්‍රකාර මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද දැනට එකී උකස්කරයේ ප්‍රකාර රුපියල් හාරදහස් පන්සිය හැත්තෑ අටයි සත හතක් (රු. 4,578.07) ආයතනයට ගෙවිය යුතුව ඇති හෙයින්ද ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ ආඥාපනත (1956 සංශෝධිත නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 402 අධිකාරය) යටතේ ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ජේ. පාලක්‍රිෂ්නන් ජන නොතාරිස් විසින් 61.5.20 දින ලියා සහතික කරනලද අංක 51 දරන උකස්කරයේ ප්‍රකාර උකස් කළ දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරු වන ජී. ද ඇස්. පණ්ඩිතසේකර විසින් එකී මුදල වූ රු. 4,578.07 ද වර්ෂයකට සියයට 5½ බැගින් 65.2.2 දින සිට විකුණනු ලබන දින දක්වා රු. 4,000 වන මුළු මුදලට පොළියද වෙන්දේසි ගාස්තුද අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සම්මත කරගන්නා ලදී.

හි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

292, ගාලු පාර,
කොළඹ 3,
1965 නොවැම්බර් 12 දින දිය.

11-773

---

## පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ 1966 වර්ෂයට තුවක්කු බලපත්‍ර අලුත්කිරීම

පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1966 වර්ෂයට අලුත්කිරීම 1965 නොවැම්බර් මස 20 වෙනි දින සිට ඒ ඒ කොට්ඨාසවල ප්‍රාදේශිය ආදායම් පාලක නිලධාරින් විසින් කරගෙන යනු ලැබේ. එසේ හෙයින් මේ සම්බන්ධ සියලුම ඉල්ලුම්පත් ඒ ඒ ප්‍රාදේශිය ආදායම් නිලධාරින් වෙත යැවිය යුතුය. තමන්ගේ තුවක්කු බලපත්‍ර 1965 දෙසැම්බර් මස 31 වෙනි දින හෝ ඊට කලින් අලුත්කරවා ගන්නා ලෙස මහජනයාට මෙයින් දැනුම් දෙනු ලැබේ. 1966 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම 1965 වර්ෂයේ බලපත්‍රයත් ඊට අයත් තුවක්කුවත් බලපත්‍ර අලුත්කරන නිලධාරි තැනගේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් දිනෙන් පසු බලපත්‍ර අලුත් කරවා ගන්නා අයවලුන් බලපත්‍ර ගාස්තුවට සමාන දඩ මුදලක්ද ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

2. යම් තුවක්කු බලපත්‍රයක් 1966 වර්ෂයට අලුත් නොකිරීමට බලාපොරොත්තුවේනම් හෝ අබලන් තුවක්කු ඇත්නම් ඒවා, ඊට අදාල බලපත්‍ර සමඟ බලපත් අලුත්කරන නිලධාරිතැනට හෝ මෙම කාර්යාලයට 1965 දෙසැම්බර් මස 31 වෙනි දිනට ප්‍රථම භාරදිය යුතුය.

3. 1966 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පළමු අලුත් කරවා නොගත් සෑම බලපත්‍ර හිමියෙක් වෙනුවෙන්ම නඩු පවරන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

අහමඩ් ඉස්මයිල් මොහිදීන්,
පුත්තලමේ දිසාපති.

1965 නොවැම්බර් මස 5 වෙනි දින,
පුත්තලම දිසාපති කාර්යාලයේදිය.

11-594

---

## 1966 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම

1966 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම 1965 දෙසැම්බර් මස 1 වැනි දින සිට ආරම්භ වේ. බලපත්‍ර අයිතිකරුවන් ඔවුන් පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් බලපත්‍ර අළුත්වැඩියා කරගත යුතුයි. එම කාර්යාලය මගින් 1966.3.31 වැනි දින දක්වා බලපත්‍ර අළුත්වැඩියා කරනු ලැබේ. ඉන් පසු බලපත්‍ර අළුත්වැඩියා කරනු ලබන්නේ කළුතර කච්චේරිය මගිනි. ඒ ඒ ප්‍රදේශ භාර ආදායම් නිලධාරින්ගේ ලිපිනයන් පහත දැක්වේ :—

(අ) කළුතර තොටමුණ—ප්‍රාදේශිය ආදායම් නිලධාරි, කළුතර.

(ආ) පානදුර තොටමුණ—ප්‍රාදේශිය ආදායම් නිලධාරි, පානදුර.

(ඉ) රයිගම් කෝරළය—ප්‍රාදේශිය ආදායම් නිලධාරි, හොරණ.

(ඊ) බටහිර පස්දුන් කෝරළය—ප්‍රාදේශිය ආදායම් නිලධාරි, මතුගම.

(උ) මහපත්තුව—ප්‍රාදේශිය ආදායම් නිලධාරි, අගලවත්ත.

(ඌ) ගහබඩ පත්තුව—ප්‍රාදේශිය ආදායම් නිලධාරි, බුලත් සිංහල.

2. බලපත්‍ර ගාස්තු වශයෙන් මුද්දර භාරගනු නොලැබේ. පැරණි බලපත්‍ර නැතිවී නම් රුපියලක් ගෙවා බලපත්‍ර පිටපතක් ප්‍රාදේශිය ආදායම් නිලධාරිගෙන් ලබාගත යුතුයි. 1965 වර්ෂයේ බලපත්‍රය ඉදිරිපත් නොකරන අයගේ බලපත්‍ර අළුත්වැඩියා නොකරනු ලැබේ. 1965.12.31 වැනි දිනට ප්‍රථමයෙන් බලපත්‍ර ගාස්තු ගෙවා අළුත්වැඩියා නොකළ අයට බලපත්‍ර ගාස්තුවට සමාන දඩ මුදලක් ගෙවීමට සිදුවේ. 1966.3.31 වැනි දිනට ප්‍රථම බලපත්‍ර අළුත්වැඩියා නොකළ අයට නීති මගින් දඬුවම් පමුණුවනු ලැබේ.

3. යම් තුවක්කු බලපත්‍රයක් 1966 වර්ෂයට අළුත් නොකිරීමට බලාපොරොත්තුවේ නම් එකී බලපත්‍රය හා ඊට අයිති තුවක්කුවද බලපත්‍ර අළුත්කරන නිලධාරිතැනට හෝ මෙම කාර්යාලයට 1965 දෙසැම්බර් මස 31 වැනි දිනට හෝ ඊට පෙර භාරදිය යුතුයි.

මා. සිවනාදන්,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1965 නොවැම්බර් මස 6 වැනි දින,
කළුතර කච්චේරියේදිය.

11-573

---

## සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)

### 277 (3) වගන්තිය යටතේ සීමාසහිත කළම්බු ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1961 ජනවාරි 13 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත කළම්බු ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සීමාසහිත කළම්බු ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මයෝස සෙල්ලයියා වූ මම, සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
සමාගම් රෙජිස්ට්‍රාර්

1965 නොවැම්බර් මස 6 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදී ය.

11-572

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### දකුණු පළාත—හම්බන්තොට දිස්ත්‍රික්කය

### කොළඹ—ගාල්ල—හම්බන්තොට—වැල්ලවාය පාරේ අංක 163/2 දරන පාලම වසා තැබීම

ඉහත සඳහන් පාරේ අංක 160¾ සැතපුම් කණුව සිට අංක 163¼ සැතපුම් කණුව දක්වා වූ මාර්ග කොටස ඇතුළත තිබෙන ඉහත සඳහන් පාලමේ හාවටුව නැවත තැනීමේ වැඩ කරගෙනයාම සඳහා එම පාරේ අන්දල්ල මං සන්දියේ සිට වීරවිල මං සන්දිය (පන්නගමුව මං සන්දිය) දක්වා මාර්ගය සියළුම රථවාහන ගමන් කළ නොහැකි වනසේ 65.11.22 වෙනි දින සිට 66.2.22 දින දක්වා වසා තබන බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරමි.

විකල්ප මාර්ගය වනුයේ අන්දල්ල-තිස්ස පාරේ අන්දල්ල මං සන්දියේ සිට දෙබරවැව මං සන්දිය දක්වා යහ එම මං සන්දියේ සිට වීරවිල-තිස්ස-කතරගම පාරේ වීරවිල මං සන්දිය (පන්නගමුව මං සන්දිය) දක්වා මාර්ගයයි.

ආර්. ජී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ.
1965 නොවැම්බර් මස 12 වැනි දින.

11-659

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ සැ. 243 ද. 68 පු. 43හි උප්පකුලම් වීපි පාර වැටි ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අළුත්වැඩියා කරනු ලබන හෙයින්, 1965.12.2 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 6 සිට 8 දක්වා අර්ධ වශයෙන් ද, 65.12.2 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 8 සිට 1965 12.3 වෙනි සිකුරාදා දවල් 12 දක්වා සම්පූර්ණ වශයෙන්ද රථ වාහන ගමනා ගමනයට වසා තබනු ලැබේ. මේ කාලය තුළදී රථ වාහන ගමන ගමනයට සැ. 243 ද. 47හි පියිපි නාදුන්කුලම පාරේ පිහිටි දුම්රිය හරස් පාරෙන් ඉඩ සලසනු ලැබේ.

ආර්. ඒ. චෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

11-640

---

## දැන්වීමයි

### ගා/ශ්‍රී සාරානන්ද විද්‍යාලය පිරිවෙන, මැටිවිලිය, පිටිගල

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ මැටිවිලියේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට මීගහතැන්නේ විමලසාර ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇතිනම් මා වෙත දැන්විය යුතුය.

ටී. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ජී. එස්. පී. ඒ. 74.
1965 නොවැම්බර් මස 11 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දිය.

11-642

---

## 1966 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම

1966 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම 1965 දෙසැම්බර් මස 1 වැනි දින ආරම්භ කරනවා ඇත. තුවක්කු අයිතිකරුවන් තමන් පදිංචි ප්‍රදේශය භාර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයෙන් බලපත්‍ර අළුත්වැඩියා කරගත යුතුයි. ත්‍රිකුණාමලය නාගරික සභාවට අයත් බලපත්‍ර ත්‍රිකුණාමලය කඩවත් සතර කෝරළේ ආදායම් නිලධාරි තුමා වෙත යැවිය යුතුය. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රදේශ භාර ආදායම් නිලධාරීන්ගේ ලිපිනයන් පහත දැක්වේ :—

(අ) ත්‍රිකුණාමලය කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරී, ත්‍රිකුණාමලය.

(ආ) කොඩ්ඩියාර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි, මූතූර්.

(ඇ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි, කින්නියා.

(ඈ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි, කන්තලේ.

(ඉ) කට්ටුකුලම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී, කුච්චවෙලි.

(ඊ) කට්ටුකුලම් පත්තුව බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි, මැදවච්චිය, ගෝමරන්කඩවල.

තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා මුද්දර භාරගනු නොලැබේ. බලපත්‍ර නැතිවූ විට රුපියලක් ගෙවා ත්‍රිකුණාමලය දිසාපතිගෙන් පිටපතක් ලබාගත යුතුයි. පසුවූ වර්ෂයේ බලපත්‍රය හෝ එහි පිටපතක් ඉදිරිපත් නොකරන අයට අළුත් බලපත්‍ර නිකුත් කරනු නොලැබේ. 1965 දෙසැම්බර් මස 31 වෙනිදට ප්‍රථමයෙන් නව වර්ෂය සඳහා අළුත් බලපත්‍රයක් නොගන්නා අයට බලපත්‍රයේ ගාස්තුවට සමාන දඩ මුදලකට යටත් වන්නට සිදුවේ. 1966 මාර්තු මස 31 වැනි දින දක්වා ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් ඉහතකී දඩ මුදල් අයකර බලපත්‍ර අළුත්වැඩියා කරනු ලැබේ. 1966 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම බලපත්‍ර අළුත්වැඩියා නොකළ අයට නීති මාර්ගයෙන් දඬුවම් පමුණුවනු ලැබේ.

යම් තුවක්කුවක් පාවිච්චි නොකළ හැකි තත්ත්වයේ තිබේනම් 1965 වර්ෂයට නිකුත් කරන ලද බලපත්‍රයක් සමග කච්චේරියට හෝ ග්‍රාම සේවකයාට හෝ ළඟම ඇති පොලීසියට 1965 දෙසැම්බර් මස 31 වැනිදට ප්‍රථමයෙන් භාර දිය යුතුයි. එසේ භාර දීමට සිදුවුවහොත් ග්‍රාම සේවකගෙන් හෝ පොලිස් නිලධාරියාගෙන් එම තුවක්කුව භාර ගත් බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි. එය එසේ භාර නොදෙනු ලැබුවහොත් 1966 වර්ෂය සඳහා ගෙවිය යුතු ගාස්තුව ගෙවා බලපත්‍ර අළුත්වැඩියා කරගැනීමට සිදුවේ.

එම්. බී. සේනානායක,
ත්‍රිකුණාමලය දිසාපති.

1965 නොවැම්බර් මස 10 වැනි දින.
ත්‍රිකුණාමලය කච්චේරියේ දිය.

11-634

---

## රජයේ දැන්වීමයි

### කොළරා රෝගය—විශාඛාපට්ටනම් වරාය

විශාඛාපට්ටනම් වරාය කොළරා වසංගතයෙන් දැන් තොර බව දක්වන අතර, එළමස්, මාළු ආදිය මෙයි ගෙන්වීමට තිබුණ තහනම දැන් ඉවත් කර තිබෙන බව මෙයින් දන්වමි.

කෙසේ වෙතත්, කොළරා රෝගයට භාජනය වූ බඩු බාහිරාදිය සහ මගීන් සාමාන්‍ය නිරෝධායන වැඩ කටයුතුවලට භාජනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ,
නිරෝධායන දෙපාර්තමේන්තුව.

නිරෝධායන කාර්යාලය,
කොළඹ, 1965.11.13.

11-764

---

## රජයේ දැන්වීමයි

### කොළරා—අහමඩබෑඩ් ගුවන් තොටුපළ

අහමඩබෑඩ් ප්‍රදේශය කොළරා රෝගය පැතිර ඇති ප්‍රදේශයක් බවට ප්‍රකාශ කර තිබෙන බව මෙයින් සියලුදෙනාගේම දැනගැනීම පිණිස ප්‍රකාශ කරමි. එබැවින් ඉහත සඳහන් ප්‍රදේශයෙන් පැමිණෙන මගීන්ගෙන් කොළරා රෝගයට අත් එන්නත් කිරීමේ සහතිකයට අමතරව ලංකාවේ කිසියම් වරායක ගොඩබාන අළුත් මාළු, කටුවෙන් ආවරණවූ මාළු (ෂෙල් ෆිෂ්), එළවළු, පළතුරු, හකුරු, මස්කට් (එසේ නැතහොත් කොළරා රෝගය පැතිර යාමට අදාල වෙන වෙනත් ආහාර ද්‍රව්‍යයන්) ලංකාවට ගෙන ඒම තහනම්කර ඇත.

ඉහත සඳහන් ප්‍රදේශය කොළරා රෝගයෙන් තොරවූ වහාම තවත් දැන්වීමක් පළ කරනු ලැබේ.

අධ්‍යක්ෂ,
නිරෝධායන දෙපාර්තමේන්තුව.

නිරෝධායන කාර්යාලය,
කොළඹ. 65.11.13.

11-763

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය. **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.